Vidyodaya J., Soc., Sc. Vol. 1 No. 1 January 1987 pp. 47 - 58

# ඉසුරුමුනි විහාරයේ මිනිසා සහ අශ්ව හිස පිළිබඳ නව සංකල්පයක්

**ආචාර්ය දිනරත්න ගමගේ**
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ඉසුරුමුනි විහාරය පැරණි අනුරාධපුර නගරයේ සිට සැතපුම් එකක් පමණ දකුණු දෙසින් පිහිටා ඇත. ඉසුරුමුනි විහාරය සහ පැරණි වෙස්සගිරි විහාරයද සමීපව පිහිටා තිබුණු විහාරයන් දෙකක් ලෙසට මෙතෙක් පැවති ව්‍යාකූල අදහස දැන් බොහෝදුරට නිරාකරණය වී ඇත. නූතන දඹුලු විහාරයෙන් (පැරණි ජම්බුකෝල ලෙන) සොයා ගෙන ඇති බ්‍රාහ්මී ශිලා ලිපියක් අනුව පැරණි වෙස්සගිරි විහාරය දඹුල්ලේ පිහිටා තිබූ බව අනාවරණය වී ඇත.1 මේ අනුව පැරණි සෙල්ලිපිවල සඳහන් වන ඉසිරමෙනු විහාරයත් නූතන ඉසුරුමුනිය නමින් හඳුන්වනු ලබන විහාරයත් එකම විහාරයක් බව දැන් බොහෝ දුරට පිළිගැනේ. මේ අනුව අපේ මූලාශ්‍රයන්හි ඉසිරමන, ඉස්සර සමන, ඉස්සරසමනාරාම, ඉස්සර සමනක, ඉස්සරනිම්මාන යනාදී සියලු නම් වලින් හැඳින්වෙන්නේ ඉසුරුමුනි විහාරය බව පිළිගත හැක. ඉස්සරසමන විහාරය ප්‍රථමයෙන්ම කරවන ලද්දේ දේවානම්පියතිස්ස රජු විසින් බව මහාවංශය සඳහන් කරයි.2

මිනිසා සහ අශ්ව හිස කැටයම් කර ඇති මූර්තිය මෙම ඉසුරුමුනි විහාරයේ ගල් කුළෙහි දක්නට ඇත. මෙම විහාරය අනුරාධපුරයේ ඇති තිසාවැවෙහි වේල්ලට පහතින් පිහිටා ඇත. මෙහි දක්නට ඇති මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තියට අමතරව කථා පුවතක් දැක්වෙන මූර්තියක්, මිනිසකු සහ ගැහැණියකගේ මූර්තියක්, (පෙම්යුවළ) දිය ක්‍රීඩාවේ යෙදී සිටින ඇතුන් දැක්වෙන කැටයම්, වාමන රූප, කුඩා ගල් විහාරයක නෙලා ඇති බුදු පිළිමයක්, යනාදියද දැකිය හැක. පෙරේරා පෙන්වා දී ඇති පරිදි3 මේ සියළු කැටයම් එකට ගෙන සලකා බලතහොත් සමහරවිට මේ සියළු කැටයම් වලින් එක අදහසක් දීමට උත්සාහ ගෙන ඇත්ද යන්න සලකා බැලීම සාධාරණ බව මාගේ ද හැඟීමයි.

කෙසේ වුවත් මෙහිදී ප්‍රධාන වශයෙන් උත්සාහ දරන්නේ මිනිසා සහ අශ්වහිස පිළිබඳ කරුණු සාකච්ඡා කිරීමටයි. එහිදී අනෙකුත් බාහිර සාධක අවශ්‍යයෙන්ම විමර්ශණයට භාජනය වනු ඇත.

---

1. S. Paranavithana, Dambulla in ancient times, Vesak Number 2513, Published by the Dept. of Cultural Affairs, Ceylon, Colombo, 1969, pp-65-69.
2. මහාවංශය සුමංගල හිමි සංස්කරණය 20 පරි,X IX මෙහි පැරණි ව්‍යවහාර නාමය ඉසිරමන බව ඉසුරුමුනියේ සිට සැ: 1/4පමණ දකුණට පිහිටා ඇති දැන් වෙස්සගිරිය නමින් හැඳින්වෙන ස්ථානයේ පිහිටි ගලක කොටා ඇති පළමුවන හෝ දෙවන සියවසට අයත් ශිලා ලිපියක දැක්වේ.
3. A. D. T. E. Perera, Ancient Ceylon, Journal of the Archaeological Survey Department of Sri Lanka, No. 3. Aug. 1979. P. 244.

ශ්‍රී ලංකාවේ ඇති මූර්ති කැටයම් අතර අග්‍රගණ්‍ය තත්වයේ ලා සැලකෙන මූර්ති කර්මයක් වූ මෙම මිනිසා සහ අශ්ව හිස සහිත කැටයම පිළිබඳව දේශීය මෙන්ම විදේශීය උගතුන්ද ඉතාමත් අභිරුචියකින් යුතුව විවිධ මත පළකොට ඇත. මහාචාර්ය පරණවිතාන1 පෙන්වා දෙන පරිදි මෙම මූර්තිකර්මයෙන් ඉදිරිපත් කරන අදහස පිළිබඳ කථා සම්ප්‍රදයක් නොතිබීම මෙවැනි විවිධ අදහස් ඇතිවීමට හේතුවක් වී ඇත.

මෙම මූර්තිකර්මය හඳුනා ගැනීම සඳහා කරනු ලබන උත්සාහයේදී කුමන කරුණක් අරභයා මෙය කරන ලද්දේද, එහි ගැබ් වී ඇති ප්‍රධාන චරිත ලක්ෂණ කවරේද එසේම එම මූර්තිය පිහිටා ඇති ස්ථානය කොතෙක් දුරට මූර්තියෙන් දැක්වීමට අදහස් කරන අදහසට කොතෙක් දුරට ගැලපේද යන්න සහ මෙම විහාරස්ථානයේ දක්නට ඇති අනෙකුත් කැටයම් මෙම මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තිය සමග කිනම් අන්දමේ සම්බන්ධතාවයක් පවත්වන්නේද යනාදී කරුණු විමර්ශණයට භාජනය කිරීම ඉතා වැදගත් වනු ඇත.

තිසාවැවේ වේල්ලට පහතින් පිහිටා ඇති ගල්පර්වත පන්තියෙන් එකක මෙම මූර්තිය නෙලා ඇත. පිහිටි ගලෙහිම නෙලා ඇති වාඩිවී සිටින මිනිසා සහ එම මිනිසාගේ දකුණු උරහිසට පිටුපසින් දක්වා ඇති අශ්ව හිස සහිත මෙම මූර්තිය පොළොව මට්ටමේ සිට අඩි 15 ක් පමණ උඩින් පිහිටා ඇත. මෙම මූර්තියට තරමක් දකුණුපසින් එම පර්වතයෙහිම ඒ හා සමාන උසකින් යුතුව පිහිටි ගලෙහිම බෞද්ධ පිළිම ගෙයක්ද ඒ තුළ බුදු පිළිමයක්ද නෙලා ඇත. එම පිළිමගෙයට අවතීර්ණ වීම සඳහා ගල් පඩි පෙළක්ද තනා ඇත. මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තියට ආදේශක වශයෙන් පිහිටුවා ඇති මෙම කුඩා පිළිමගෙය පිළිබඳව මෙතෙක් කිසිම දේශීය හෝ විදේශීය විද්වතෙක් වැඩි සැලකිල්ලක් දක්වා ඇති බවක් නොපෙනේ. මහාචාර්ය පරණවිතාන මේ පිළිම ගෙය පිළිබඳව දක්වා ඇත්තේද ඉතා මඳ සැලකිල්ලකි. එහෙත් මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තිය හඳුනා ගැනීමේදී මෙම බුදු පිළිමයේ ඇති වැදගත්කම පිළිබඳව මෙම ලිපියේ පසුභාගයේ විස්තර කෙරෙනවා ඇත.

මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තිය සාමාන්‍ය මිනිස් ප්‍රමාණයට වඩා කුඩාය. ඉහටියේ සිට හිසෙහි මුදුන දක්වා උස අඩි 2 යි අඟල් 7 ½ කි. නොගැඹුරු ආරුක්කු වක ආකාරයේ ගල්කුහරයක මෙම මූර්තිය නෙලා ඇත. මිනිසා වාඩිවී සිටින්නේ කිසියම් ආසනයක නොව ගල් කුහරයේ පහත ලෑල්ලක් වැනි සමතලා ගල්තලාවමතය වාඩිවී සිටින මිනිසාගේ වම් කකුල සමතලා ගල්තලාව මත වැතිර දණහිසෙන් නැවී නැවත වම් පතුල දකුණු කලවයේ ස්පර්ශ වී ඇත. වම් අත උරහිසින් වෘත්තාකාරව නැමී තරමක් සෘජුව පහලට වැටී සමතලා ගල්තලාව මත අත්ල තබා ඇත. දකුණු පාදය ඉස්සී දණහිසින් නැවී නැවත පාදයේ පතුල ගල්තලාව මත පිහිටුවා ඇත. දිගු කළ දකුණු අත දකුණු පාදයේ දණහිසින් දරා සිටී. ශරීරයේ උඩුකය නග්නව ඇත. ශරීරයේ ඉහටිය ප්‍රදේශයේ සිට දකුණු හා වම් පාදයේ දණහිසට මඳක් ඉහල ප්‍රදේශය දක්වා සිනිඳු වස්ත්‍රයක් හැඳ සිටින බවක් පෙනේ. පැළඳ සිටින මාලය (සමහර උගතුන් පෙන්වන පරිදි පූනනූල) පපුව ප්‍රදේශය තෙක් වැටී ඇත. විශාල කර්ණාභරණ පැළඳ සිටී. දකුණු අතෙහි බාහු වළල්ලක් පැළඳ සිටී. පුරුෂ රූපයේ හිසෙහි තොප්පියක් පැළඳ සිටින බවක් සමහරු පෙන්වා දෙති. මෙහි හැඩය අනුව එය කිසියම් ලෝහයකින් නිමකළ හිස් ආවරණයක් විය හැකි බව පාකර් පෙන්වා දෙයි.2

---

1. S. Paranavitana, Artibus Asaie, Vol. XIV, 1953, The Sculpture of man and horse near Tisavava at Anuradhapura, Ceylon, Pl. 167.
2. H. Parker, Ancient Ceylon, London, p. 545.

වාඩිවී සිටින පුරුෂ රූපයේ දකුණු බාහුවට පිටුපසින් ගලින් මතුවන ආකාරයට අශ්ව හිස මූර්තිමත් කොට තිබේ. හිස පිහිටුවා ඇති ආකාරයට අශ්වයාගේ ශරීරය ගලෙහි අභ්‍යන්තරයේ ඇති ලෙස සිතීමට කැටයම් කරුවා උත්සාහ දරා ඇත. අශ්ව හිසෙහි පහත කොටස කැඩී ඇති අතර මෑත කාලයේදී එය සිමෙන්තියෙන් ප්‍රතිසංස්කරණය කර ඇත. වාඩිවී සිටින මිනිසා අශ්වයාගේ නාස් ලණුව අල්ලාගෙන ඇති බවක් වින්සන්ට් ස්මිත්[1] පවසා ඇත. එහෙත් මෙය වැරදි වැටහීමක් බවත්, වින්සන්ට් ස්මිත් එසේ නාස්ලණුව ලෙස තේරුම් ගෙන ඇත්තේ වාඩිවී සිටින පුරුෂයාගේ දකුණු බාහුවේ ඇති බාහු වලල්ල බවත් මහාචාර්ය පරණවිතාන[2] පෙන්වා දෙයි.

මෙම මූර්තියේ ඇති කලාත්මක අගය පිළිබඳව ප්‍රථමයෙන්ම අවබෝධ කරගත් ආනන්ද කුමාරස්වාමි[3] විසින් මේ මූර්තිය පිළිබඳ ඔහුගේ අදහස් දක්වා ඇත. ආනන්ද කුමාරස්වාමි මූලික වශයෙන්ම අශ්ව මූර්තිය පදනම් කරගෙන සුප්‍රසිද්ධ ඉන්දියානු මිථ්‍යාකථාවක එන ගංගාව රෝහණය පිළිබඳ වෘත්තාන්තය සිහියට ගනිමින් මෙහි වාඩි වී සිටින පුරුෂයා කපිල මුනිවරයා ලෙස හඳුනාගෙන ඇත. එහෙත් මෙම අදහස දැනට බොහෝ උගතුන් විසින් ප්‍රතික්ෂේප කොට ඇත. අශ්වයා හඳුන්වා දීමෙන් පමණක් මෙම පුරුෂ රූපය කපිල මුනිවරයා වශයෙන් පිළිගැනීමට ඇති සාධක මඳ බව මහාචාර්ය වොගෙල්[4] පෙන්වා දී තිබේ. මහාචාර්ය පරණවිතාන[5] මෙම මූර්තියෙහි දක්වෙන පුරුෂයා යෝගී විලාශයකින් වාඩිවී නොසිටීමෙන්ම ආචාර්ය කුමාරස්වාමිගේ මතය වූ මේ පුරුෂයා කපිල මුනිවරයා වශයෙන් පිළිගැනීම ප්‍රතික්ෂේප වන්නේ යයි පවසා ඇත.

ඉසුරුමුනියේ ඇති මිනිසා සහ අශ්ව හිස පිළිබඳ පෘථුල අධ්‍යයනයක් කළ මහාචාර්ය පරණවිතාන[6] මෙම මූර්තියෙන් හඳුන්වා දෙන්නේ වෛදික දෙවිවරුන් වන පර්ජන්‍ය සහ අග්නි බවට මතයක් ඉදිරිපත් කොට ඇත. පරණවිතාන අනුව මේ දෙවිවරුන් දෙදෙනාගෙන් සංකේතවත් වන්නේ වර්ෂාව සහ ශුෂ්ක හෙවත් වියළි බවයි. මෙම මතය දැනට විද්වතුන් විසින් පිළිගෙන ඇති සාමාන්‍ය මතය වේ.

මහාචාර්ය පරණවිතානගේ මතයට ප්‍රධාන වශයෙන් පදනම් වී ඇත්තේ එකල පැවති කෘෂිකාර්මික ජීවන රටාවය. ඈත එපිට වෙල්යායක් දෙස මේ පුරුෂයා බලා සිටින ලීලාවක් පරණවිතාන මෙයින් අදහස් කරයි. මෙම මතය ගොඩ නැගීම සඳහා අභයගිරි විහාරයේ තිබී හමුවී ඇති පස්වන කාශ්‍යප රජුගේ දහවැනි ශතවර්ෂයට අයත් සෙල් ලිපියක්මොහු විසින් පදනම් කරගෙන ඇත. මෙම සෙල්ලිපියේ පොදොනවුළු පුළුඩාවුලුයෙන් කෙත්කම් සුලබ් කොට[7] යනුවෙන් සඳහනක් ඇත. සමහර උගතුන් පොදෙනවුළු පුළුඩාවුලු යනු වැව් දෙකක් වශයෙන් හඳුනාගෙන ඇත. මහාචාර්ය පරණවිතාන මෙයට වෙනස් අදහසක් දරමින් මෙයින් හැඟවෙන්නේ වෛදික දෙවිවරුන් දෙදෙනෙක් වන පර්ජන්‍ය සහ අග්නි බව පෙන්වා දෙයි. කෘෂිකාර්මික කටයුතු සඳහා වර්ෂාව මෙන්ම ග්‍රීෂ්මයද අවශ්‍ය බවත් ඒ අනුව පොදෙනවුළු යන්නෙන් පර්ජන්‍ය

---

1. Vincent A. Smith, A History of Fine Art in India & Ceylon, P. 148.
2. S. Paranavitana, op. cit, p. 169.
3. A. K. Coomaraswamy, Figure of Kapila at Isurumuniya Vihara, Anuradhapura, Spolia Zeylanica, Vol. VI, 1910, pp;132-133.
4. J. Ph. Vogel. Buddhist Art in India, Ceylon and Java, 1936, p. 64.
5. S. Paranavitana, op. cit, p. 176.
6. S. Paranavitana, op. cit, p. 176.
7. Epigraphia Aeylanica, Vol. I, P. 43 (Anuradhapura Slab Inscription of Kassapa V) Artibus Asiae, Vol. XIV, p. 179.

●හවත් වර්ෂාවට අධිපති වෛදික දෙවියාත් පුළුඩාවුලු යන්නෙන් ගින්න හෙවත් ග්‍රීෂ්මය සංකේතවත් කරන බවත් ඔහු පෙන්වා දෙයි. පුළුඩා යන්න සංස්කෘත Plostr යන වචනයෙන් බිඳී සිංහලයට පුළුස්සන සහ ප්‍රෂ්ටු යනුවෙන් අරුත් දෙන බව පරණවිතාන අදහස් කරයි. පරණවිතාන මතය පිළිබඳ අදහස් දක්වන පෙරේරා[1] ක්‍රි. ව. 10 වන සියවසේ පමණ ජීවත් වූ රජෙක් ඒ වන විට ගිනි දෙවියා වශයෙන් අග්නි දෙවියා ප්‍රචලිතව සිටියදී වෛදික Plostr වැනි වචනයක් ඒ සඳහා යොදා ගත්තේ ඇයිද යන්න තේරුම් ගත නොහැකි බව ප්‍රකාශ කොට ඇත.

ක්‍රි. ව. 10 වන සියවසේ මේ සෙල්ලිපිය කරවන ලද කාලය වන විට ලංකාවේ පර්ජන්‍ය හෝ අග්නි දෙවියා පිළිබඳ ඇදහීමක් පැවතුණ බවක් අපට නොපෙනේ. ලංකාවේ වෙනත් කිසිම සාහිත්‍ය හෝ පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක මේ කාලය තුළ පර්ජන්‍ය හෝ අග්නි දෙවියා ඇදහීම පිළිබඳ සඳහනක්ද හමු නොවේ. එසේම සංස්කෘත Plostr යන වචනය සිංහලයට පුළුඩා යනුවෙන් බිඳී ආ ආකාරයද පරණවිතාන පැහැදිලි ලෙස පෙන්වා දී නැති බව පෙරේරා සඳහන් කරයි.[2] එසේම පොදෙන් යන සිංහල ව්‍යවහාර නාමය වෛදික පර්ජන්‍ය යන්නෙන් වාග්විද්‍යානුකූලව බිඳී ආ ආකාරයද ඔහු පැහැදිලි වශයෙන් විස්තර කර නොමැත.

ඉසුරුමුනියේ වාඩි වී සිටින පුරුෂයා දක්වෙන මූර්තිය පර්ජන්‍ය වශයෙන් අප විසින් මහාචාර්ය පරණවිතාන මතය අනුමානයෙන් පිළිගනු ලැබුවද පර්ජන්‍ය මූර්ති ඉතාම විරලවූවා පමණක් නොව අඩු තරමින් ඉන්දියානු කලා සම්ප්‍රදයේ පවා එවැනි මූර්තියක් දක්නට නැති තරම් බව මහාචාර්ය ලොහයිසන් මහත්මිය[3] පෙන්වා දෙයි. එසේම තමා කිසි දිනක එවැනි මූර්තියක් දැක නැති බවද ඇය තව දුරටත් කියා සිටී. පර්ජන්‍ය ඉන්ද්‍ර ආර්යයන් විසින් දැන සිටියද පසු කාලයේ එම දෙවියා ජනප්‍රිය දෙවියකු වශයෙන් ඉදිරියට ආ බවක් නොපෙනේ. මේගිරි හෝ මෙත්ගිරි යන පදයන්ගෙන් බිඳී ආ බව සැලකෙන මේඝගිරි යන වචනයෙන් අනුරාධපුරයුගයේ කිසියම් කාලපරිච්ඡේදයකදී ඉසුරුමුනි කැටයම් ඇතුළත් එම පර්වතය හැඳින් වූ බව මහාචාර්ය පරණවිතාන[4] පෙන්වා දෙයි. මේඝය, වළාකුළ නැතහොත් වර්ෂාවට අධිපති දෙවියා සංකේතවත් කරන පර්වතය මේඝගිරි (Cloud rock) යනුවෙන් හඳුන්වන්නට ඇතැයි පරණ විතාන අදහස් කරයි. එසේ වුවද පර්වත ආශ්‍රිතව පැරණි යුගයේ විහාරස්ථාන තැනීම සාමාන්‍ය සම්ප්‍රදයක් වූ නිසා ඉහත සඳහන් මේඝගිරි යන පදයෙන් පර්ජනය හෙවත් වර්ෂාවට අධිපති දෙවියා සංකේතවත් කළ පර්වතයක් ලෙස සැලකීම තරමක් අපහසුය. පැරණි ඉන්දියාවේ මෙන්ම ලංකාවේද පර්වත ගුහා ආශ්‍රිතව බෞද්ධ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් ආරාම තනවනු ලැබීය. වෙස්සගිරි, චේතියගිරි, සීගිරි යන නම් වලින් එවැනි පැරණි ආරාම හැඳින්වූ බවට සාධක ඇත. මෙත්ගිරි විහාරය අනුරාධපුරයට උතුරින් පිහිටා තිබූ විහාරයක් බව දාඨාවංශයේ සඳහන් කර ඇත. පරණවිතානගේ අදහස නම් එනමින්ම හැඳින්වුන විහාරයක් අනුරාධපුරයට දකුණින්ද පිහිටා තිබෙන්නට ඇති බවත් එම ස්ථානය ඉසුරුමුනිය ලෙසින් හඳුනාගත හැකි බවත්ය.

ජාත්‍යන්තර කීර්තියට පත් සීගිරි චිත්‍ර පිළිබඳව මහාචාර්ය පරණවිතාන විසින් කරන ලද පර්යේෂණයේදී සීගිරිය කුවේරයාගේ ආලකමන්දව හා සමකිරීමට ඔහු උත්සාහ ගෙන තිබේ. කුවේරයාගේ ආලකමන්දව නිතර වර්ෂාව ගහණ වූ ස්ථානයක

---

1. A. D. T. E. P. Perera, op. cit, p. 246
2. A. D. T. E. Perera, op. cit, p. 246.
3. J. E. Van Lohuizen-De Leeuw, The Rock-Cut Sculptures at Isurumuni, Ancient Ceylon, Journal of the Archaeological Survey Dept, of Sri Lanka, No. 3, Aug, 1979, p.327.
4. S. Paranavitana, op. cit p. 186.

පිහිටාතිබූ බවත්, සීගිරි චිත්‍රවල දැක්වෙන පලාවන් ස්ත්‍රී රූප මේඝලතා ලෙසත් රන්වන් චිත්‍ර විජ්ජුලතා ලෙසත් පරණවිතාන අනුමාන කරයි.[1] මේඝ යන්නෙන් වැසිබර වලාකුළුත් විජ්ජු යන්නෙන් විදුලියත් සංකේතවත් කරන බව ඔහු අදහස් කරයි. මේ අනුව සීගිරිය හා ඉසුරුමුනිය යන ස්ථාන දෙකම මේඝය හා සම්බන්ධ කිරීමට පරණවිතාන උත්සාහ ගෙන ඇති බවක් පෙනේ. සීගිරියේදී පලාවන් ස්ත්‍රිය මේඝය සංකේතවත් කරන බවත් ඉසුරුමුනියේදී ගලෙහි නෙලා ඇති වාඩි වී සිටින මිනිස් රූපය මේඝ හෙවත් පර්ජන්‍ය දෙවියා සංකේතවත් කෙරෙන බවත් පරණවිතාන පෙන්වා දෙයි.

මේ අනුව මේගිරි, මෙත්ගිරි හෝ මේඝගිරි යන පදයෙන් වැසිවලා පර්වතය **(Cloudrock)** යන අර්ථය ධ්වනිත කරන්නක් වශයෙන් පරණවිතාන මතය පිළිගත්තේ නම් එම අදහස ඉසුරුමුනිය සමග මෙන්ම සීගිරිය සමගද සමාන අන්දමේ සම්බන්ධතාවයක් පෙන්වන නිසා ඉහත කී ව්‍යවහාර නාමය ඉසුරුමුනිය සඳහා පමණක් කොතෙක් දුරට ගැලපේද යන්න පිළිබඳව අප තුළ කුතුහලයක් උපදී.

ඉසුරුමුනියේ මිනිසා සහ අශ්ව හිස පිළිබඳව තවත් අදහසක් ඉදිරිපත් කරන පෙරේරා[2] මෙම මූර්තිය මහායාන බෝධිසත්ව අවලෝකිතේශ්වර නිරූපණය කරන මුල් අවස්ථාවක් ලෙස පෙන්වා දෙයි. මහායාන බෝධිසත්ව අවලෝකිතේශ්වර ඔහුගේ වාහනය වූ හයග්‍රීව සමග ඉසුරුමුනියේ මිනිසා සහ අශ්ව හිසෙන් සංකේතවත් කරන බවට ඓතිහාසික හා පුරා විද්‍යාත්මක සාක්ෂි පදනම් කොට පෙරේරා තර්ක කරයි. ක්‍රි. ව. 1 හා 2 වන සියවස්වලින් පසු ඉන්දියාවේ මහායාන ආගමේ ඇති වූ අභිවර්ධනයත් එහි බලපෑම් මේ වන විට ලංකාවටද ඇති වෙමින් තිබූ බවත් ඔහු පෙන්වා දෙයි. ලංකාවේ මහායාන ආගමේ නොබිඳුණු වර්ධනයක් අනුරාධපුර යුගයේ පෙන්වා දිය නොහැකි වුවත් ථෙරවාදයට අභියෝග කරමින් වරින් වර මහායාන අදහස් ඉස්මතු වූ බවද ඔහු පෙන්වා දෙයි.

ඉසුරුමුනි විහාරයද මෙසේ මහායානික බලවේගයට හසු වූ එක් ස්ථානයක් ලෙස පෙන්වා දීමට පෙරේරා උත්සාහ ගෙන ඇත. මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තිය මෙම මහායාන බලපෑමේ ප්‍රතිඵලයක් ලෙස හැඳින්වීම කොතෙක් දුරට සහේතුක වන්නේද? කෙසේ වුවද ඔහුගේ උත්සාහය වී ඇත්තේ ඉසුරුමුනියේ ඇති සියළුම කැටයම් සහ මූර්ති එකම ආගමික සංකල්පයකට අයත් ඒවා ලෙස පෙන්වා දීම බව පැහැදිලිය. එහෙත් ඔහු ඉදිරිපත් කරන මෙම අනුමානය හැරෙන්නට ඉසුරුමුනිය මහායානික ආගමික මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බවට වෙනත් කිසිම සාධකයක් ඓතිහාසික හෝ පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර මගින් පෙන්වා දිය නොහැක.

මහායාන අවලෝකිතේශ්වර පිළිබිඹු කරන සෑම මූර්තියකම පාහේ ආසනයක් සහිතව ඉදිරිපත් කිරීම සාමාන්‍ය සම්ප්‍රදයක් ලෙස පැවතුන බව පෙනේ. එහෙත් පෙරේරා පෙන්වා දෙන ඉසුරුමුනියේ මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තිය ආසනයක් රහිතව දක්වා තිබීමද ඔහුගේ මතයට බාධාවක් සේ පෙනේ. එමෙන්ම ඉසුරුමුනියේ වාඩි වී සිටින පුරුෂ රූපය පෙරේරා අදහස් කරන පරිදි මහායාන අවලෝකිතේෂ්වර මූර්තියක් නම් එහි හිසෙහි ධ්‍යානි බුද්ධ පිළිරුව යොද තිබිය යුතුය. එහෙත් මෙම මූර්තියේ එවැන්නක් දක්නට නොමැකිවීම ඔහුගේ අනුමානය දුර්වලකරන තවත් සාධකයක් ලෙස පෙන්වා දිය හැක. වාඩිවී සිටින ලෙස දක්වා ඇති බෝධිසත්ව හෝ දේව රූප

---

1. S. Paranavitana, Journal of the Ceylon Branch, Royal Asiatic Society, New Series, 1. pp. 129-183.
2. A. D. T. E. Perera, op. cit, p. 249.

ලංකාවේ දක්නට ඇත්තේ ඉතා විරල වශයෙන් බව ලොහයිසන්ද[1] පෙන්වා දෙයි. හමු වී ඇති අනෙකුත් අවලෝකිතේශ්වර ප්‍රතිමාවන්හි දෙනෙත් බොහෝ සෙයින් පහතට යොමා සිටින ආකාරයකින් දක්වා ඇත. එහෙත් මෙම ඉසුරුමුනි මූර්තියෙහි දැක්වෙන පුරුෂයාගේ දෙනෙත් ඈත බලා සිටින ආකාරයකින් පෙන්වා තිබේ.

ඉසුරුමුණියේ මිනිසා සහ අශ්ව හිස පිළිබඳ තවත් මතයක් ඉදිරිපත් කර ඇත්තේ මහාචාර්ය ලොහයිසන් මහත්මිය විසිනි[2] ඇය මේ පිළිබඳව අදහස් දක්වමින් ඉසුරු-මුනියේ දක්නට ලැබෙන මිනිස්රුව අයියනායක දෙවියන්ගේ යැයි මතයක් ඉදිරිපත් කොට ඇත. මේ අදහස මුලින්ම ඉදිරිපත් කොට ඇත්තේ වීරසූරිය[3] විසිනි. එහෙත් ඔහු තම අදහස් සනාථ කිරීම සඳහා එය ඉදිරියට ගෙන ගොස් නැත. මහාචාර්ය ලොහයිසන් ඉන්දියාවේ ආලම්පූර් කෞතුකාගාරයේ ඇති අයියනාර් දෙවියන්ගේ යයි සැලකෙන මූර්තිය ඉසුරුමුනියේ ඇති පුරුෂ රූපයට බෙහෙවින් සමානකම් දක්වන බවත් ඒ අනුව ඉසුරුමුනියේ පුරුෂයා සහ අශ්ව හිස සහිත මූර්තිය ලංකාවේ අයියනායක දෙවියන් වශයෙන් හඳුනාගත හැකි බවත් පෙන්වා දෙයි.

ලංකාවේ උතුරු මැද පළාතේ සණ කැලෑ මාර්ගයට අවතීර්ණ වීමට පෙර මිනිසුන් කොල අත්තක් කඩා ගසක එල්ලා වල් අලින්ගෙන් ආරක්ෂාව පතා අයියනායක දෙවියන් සිහිකිරීම සාමාන්‍ය චාරිත්‍රයක් වශයෙන් ඈත අවධියේ සිට පැවත එයි. කෙසේ වුවද ලංකාවේ මූර්ති ශිල්පයේ අයියනායකට එතරම් වැදගත්ම තැනක් ලැබී ඇති බවක් නොපෙනේ. මෙම මූර්තිය සමග අශ්වයකු දක්වා තිබීම එය අයියනායක වශයෙන් හඳුනා ගැනීමේදී වඩාත් දුෂ්කරතාවයකට පත්වීමට හේතු වී ඇත. සාමාන්‍ය-යෙන් දේව රූපයක දෙනෙත් එම දෙවියන් අදහන්නා දෙස බලා සිටින ආකාරයෙන් මූර්තිමත් කිරීම සාමාන්‍ය ශිල්පීය ක්‍රමයයි. එහෙත් මෙහි දැක්වෙන්නේ එම මිනිසා ඈත බලා සිටින ආකාරයකි. එසේ වූ විට එම මූර්තිය නෙලීමේ ඉහත කී අරමුණ ගිලිහී යනු ඇත. මේ අනුව ලොහයිසන්ගේ මතය බිඳ වැටීමට බොහෝදුරට හේතු සාධක තිබේ. මේ අනුව එම්. මෝඩ් සඳහන් කරන පරිදි ලොහයිසන්ගේ තර්කය නිගමනයකට වඩා අනුමානයක් වශයෙන් ගැනීම සාධාරණ වන්නේය.

ඉසුරුමුනි විහාරයේ මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තිය නෙලා ඇති පර්වතයේ එම මූර්තියට දකුණු පසින් ගලෙහිම කරවන ලද කුටියක බුදු පිළිමයක් තැන්පත් කුඩා විහාර ගෙයක් දක්නට ලැබේ. මෙම විහාර ගෙය පිළිබඳව මහාචාර්ය පරණවිතානද[4] සඳහන් කොට ඇතත් ඒ පිළිබඳව ඔහු වැඩි සැලකිල්ලක් දක්වා ඇති බවක් නොපෙනේ. මෙම බුදු පිළිමය පසු කලෙක නීන්ත හා බදම වලින් ප්‍රතිසංස්කරණය කොට ඇත. මෙම බුදු පිළිමය ගලින් නෙලූ එකක්ද නැතහොත් ගඩොලින් හෝ හුණු වර්ගයකින් නෙලූ එකක්ද යන්න ස්ථිරවම කිව නොහැකි බව ඔහුගේ අදහසයි. භික්ෂූන් වහන්සේ නමක්[5] තනි කළුගල හාරා එහි උළුවස්ස මකර තොරණ ත්‍රිවංක ආසනය හා සයරියන් සමාධි ප්‍රතිමා වහන්සේද ගලෙහිම නෙලා ඇති බව සඳහන් කරයි. එමෙන්ම එය දින වකවානු වශයෙන් දේවානම්පියතිස්ස රාජ්‍ය කාලයට අයත්වන බවත්, උන්වහන්සේ පවසා ඇත. එහෙත් මෙම අදහස මහාචාර්ය පරණවිතාන[6] ප්‍රතික්ෂේප කරයි. ගල්-විහාර කුටියට ඇතුල්වන ස්ථානයේ මකර තොරනේ ඇති කැටයම අනුව එය ක්‍රි. ව.10

1. J. E. Van Lohuizent-De Leeuw. op. cit, p. 327.
2. J. E. Van Lohuizen-De Leeuw, op. cit, pp. 331-341.
3. H. E. Weerasooriya, Voices in Stones, A Book on Anuradhapura, Galle, 1958, p. 14.
4. S. Paranavitana, op. cit, p. 169.
5. නුගේතැන්නේ චන්ද්‍රානන්ද හිමි, ඉසුරුමුනි රජමහ විහාරය, අනුරාධපුර, 1959, පිට 5
6, S. Paranavitana, op. cit, p. 169.

වැනි හෝ 12 වැනි සියවසට හෝ සමහර විට ඊටත් වඩා පසු කාලයකට අයත් විය හැකි බව ඔහු සඳහන් කරයි. මහාචාර්ය වොගෙල් ඉසුරුමුනියේ මිනිසා සහ අශ්ව හිස නම් වූ කැටයම පල්ලව කලා සම්ප්‍රදය අනුව කරන ලද්දක් බවත් ඒ නිසා එම මූර්තිය ක්‍රි. ව. 7 වැනි සියවසට හෝ සමහර විටෙක ඊටත් වඩා පැරණි කාලයකට අයත් බව පෙන්වා දෙයි. ඒ අනුව මෙම ගල් විහාර ගෙය මිනිසා සහ අශ්ව හිස සහිත කැටයමට වඩා ශතවර්ෂ කීපයක් පසු කාලයට අයත් බව පරණවිතාන පෙන්වා දෙයි.

කෙසේ වුවත් මෙම කුඩා ගල් විහාර ගෙය බෞද්ධ විහාර ගෙයක් බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත. මහාචාර්ය පරණවිතාන පෙන්වා දෙන පරිදි මෙම විහාර ගෙය කරවන ලද්දේ මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තිය නෙලන ලද කාලයට පසුව බව පෙනේ. අනෙක් අතින් ඔහු විසින්ම මිනිසා සහ අශ්ව හිස වෛදික දෙවිවරුන් වන පර්ජන්‍ය සහ අග්නි සංකේතවත් කරන බව පෙන්වා දී තිබේ. මෙහිදී අපට මතු වන ගැටළුව නම් අනාගමික මූර්තියක් අසල එකම පර්වතයේ බෞද්ධ ගල්විහාර පිළිම ගෙයක් කරවීම කොතෙක් දුරට පිළිගත හැකිද යන්නයි.

අරිට්ඨ කුමරු මිහින්ද තෙරුන් වෙත පැවිදි බව ලබා පන්සියයක් අනුගාමිකයන් සමග විසූ ස්ථානයෙහි ලංකාවේ මුල්ම බෞද්ධ රජවූ දේවානම්පියතිස්ස විසින් ක්‍රි.පූ.3 වන සියවසේදී මෙම ඉස්සරසමනාරාම විහාරය කරවන ලද බව සඳහන් වේ.[1] මහාවංශය අනුව පන්සියයක් ඉසුරන් (ඉස්සර කුල) විසින් මහතෙරහු වෙත පැවිදිව විසූ තැන්හි කළ වෙහෙර ඉසුරුමුනි නම් විය. මෙම ආරාමයේ ඇති ගොඩනැගිල්ල දේවානම් පියතිස්ස රජු විසින් කරවන ලද සයවෙනි ගොඩනැගිල්ල වශයෙන් සඳහන් වේ.[2] ශ්‍රී ලංකාවට වැඩම කළ මහාබෝධියේ අංකුර අටෙන් එකක් ඉස්සරසමනාරාමයේ රෝපණය කළ බවද කියවේ.[3] මෙයින් පසු ලාංකික රජුන් නොයෙක් වර ඉසුරුමුනි විහාරයේ අභිවෘද්ධිය සඳහා නොයෙකුත් කටයුතු කළ බවට සාධක ඇත. ඉසුරුමුනියේ දක්නට ඇති කැටයම් පිළිබඳ විග්‍රහයක යෙදුණු විජේසේකර[4] ඉසුරුමුනිය හින්දු ආගමික මධ්‍යස්ථානයක්ව කලක් පවතින්නට ඇතැයි සිතිය හැකි බව පවසා ඇත. මහාචාර්ය ලොහුයිසින් ඉසුරුමුනියේ මිනිසා සහ අශ්ව හිස දැක්වෙන කැටයම අය්‍යනායක ලෙස දක්වීමේදී විජේසේකරගේ මේ අනුමානයද පදනම් කරගෙන ඇති බවක් පෙනේ. එසේ වුවද ඉසුරුමුනි විහාරය හින්දු මධ්‍යස්ථානයක් වශයෙන් පැවති බවට ඉදිරිපත් කළ හැකි කිසිදු සාහිත්‍යමය හෝ ඓතිහාසික සාධකයක් නොමැත. චන්ද්‍රමුඛසිව රජු (ක්‍රි. ව. 43–52) විසින් මණිකාරගාමයේ වැවක් තනවා එය මේ විහාරයේ ප්‍රයෝජනය සඳහා පූජා කරන ලද බව සඳහන් වේ.[5] වසභ රජු (ක්‍රි. ව. 67–111) විසින්[6] මෙහි උපෝසථ ශාලාවක් කරවන ලද අතර වෝහාරිකතිස්ස රජු (ක්‍රි.ව.209–231)[7] විසින් ඉසුරුමුනි විහාරය වටා ප්‍රාකාරයක් බඳවන ලදී. කස්සප රජු (ක්‍රි. ව. 479–497)[8] විසින් ඉසුරුමුනි විහාරයේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට විහාරභූමියද විශාල කරවන ලදී. ඒ රජු විසින් මේ විහාරයේ පැවැත්ම සඳහා බොහෝ ආධාර උපකාර කරන ලද බවද සඳහන් වේ. මේ රජු බෝධි හා උප්පලවණ්ණා නම් වූ තම දියණියන් දෙදෙනාගේ හා තමාගේ නාමයද මේ විහාරය හැඳින්වීම සඳහා යොදන ලදී. කස්සප රජු ඉසුරුමුනි

1. සුමංගල හිමි සංස්කරණය, මහාවංශය, පරි 20, ගාථා 15
2. – එම – ගාථා 19
3. – එම – පරි. 19 ගාථා 59
4. N. Wijesekera, Early Sinhalese Sculpture, Colombo, 1962, pp. 76,237.
5. මහාවංශය, පරි. 35 ගාථා, 47, 48
6. – එම – පරි. 35, ගාථා 36
7. – එම – පරි. 36, ගාථා 36
8. චූලවංශය, පරි. 34 ගාථා 10–14

විහාරය ථෙරවාද භික්ෂූන්ට පූජාකිරීමට අදහස් කළත් උන්වහන්සේලා එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළ බව සඳහන් වේ. පීතෘඝාතක රජකු විසින් එය ප්‍රතිසංස්කරණය කරන ලද නිසා එය පිළිගැනීමෙන් මහජන අප්‍රසාදයක් තමන් වහන්සේලා වෙත එල්ලවෙතැයි උන්වහන්සේලා බිය වූහ. ඉන් පසු රජු විසින් එම විහාරය බුදුන්ට පූජා කරන ලදී. ඉන්පසු ඉහතකී ථෙරවාද භික්ෂූන් වහන්සේලා මෙම විහාරය තම ශාස්තෘන් වහන්සේට අයත් වූ නිසා පිළිගැනීමට කැමති වූහ.[1] මේ සියළු සාධක අනුව අපට පැහැදිලි වන්නේ ඉසුරුමුනි විහාරය ගොඩනැගූ ක්‍රි. පූ. 3 වන සියවසේ සිට ක්‍රි. ව. 5 වෙනි සියවස පමණ දක්වා එම විහාරය බෞද්ධ විහාරයක් වශයෙන් අඛණ්ඩව පැවති බවය.

මහාචාර්ය පරණවිතාන ඉසුරුමුනි පර්වතයේ පිහිටුවා ඇති මේ කුඩා ගල් විහාරය වැඩි සැලකිල්ලක් නොදක්වා බැහැර කළද ඒ ආසන්නයේම ඇති වාඩි වී සිටින මිනිසා අශ්ව හිස සහිත මූර්තිය හඳුනා ගැනීම සඳහා මෙම පිළිමගෙය විශේෂ වැදගත් කමක් දරන බව මගේ හැඟීමයි. දේවානම්පියතිස්ස රජුගේ කාලයේදී බුද්ධ ප්‍රතිමාවක් සාදන ලද බව මහාවංශය සඳහන් කරයි.[2] දේවානම්පියතිස්ස රජු එම බුදු පිළිමය ථූපාරාමයේ තැන්පත් කළ බවත් පසුව ජෙට්ඨතිස්ස රජු විසින් එය ථූපාරාමයෙන් රැගෙන ප්‍රාචීනතිස්ස පබ්බත ආරාමයේ තැන්පත් කළ බවත් සඳහන් වේ. ඉන්දියාවේ පවා මේ වන විට බුදු පිළිම තැනීම ඇරඹී නොතිබුන බවත් කෙසේ වුවත් ලංකාවේ බුදු පිළිම තැනීම මහසෙන් යුගයට වඩා පැරණි යයි කිව නොහැකි බවත් පරණවිතාන පෙන්වා දෙයි.[3] දේවානම් පියතිස්ස සමයේ පරණවිතාන මතය අනුව බුදු පිළිම තැනීම සිදු නොවුවත් කස්සප රාජ්‍ය කාලය වනවිට බුදු පිළිම තැනීම ලංකාවේ සි නොවූවා යයි සිතිය නොහැක. කස්සප රජු ඉසුරුමුනි විහාරයේ ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කොට එම භූමිය විශාල කළ බවත්, එම විහාරය ථෙරවාදී භික්ෂූන්ට පූජා කළ විට උන්වහන්සේලා එය පිළිනොගත් බවත් පසුව ථෙරවාදී භික්ෂූන්ටම දෙනු කැ තිව, බුදු පිළිමයක් පූජා කළ බවත් මහාවංශය තව දුරටත් විස්තර කරයි. මීට අමතරව කස්සප රජු විසින් බොහෝ පිළිම ගෙවල්ද දන ශාලාද කරවූ බව සඳහන් වේ.

කස්සප රජු පිළිබඳ මහා වංශකථාව තහවුරු කෙරෙන ශිලා ලිපියක්ද අපට හමු වී ඇත. මහාවංශය පෙන්වා දෙන පරිදි කස්සප රජුට සිටි බෝය, උපුල්වන්ය යන තම දූ කුමරියන් දෙදෙනාගේ හා තමාගේ නමද ඉසුරුමුනි විහාරය හැඳින්වීම සඳහා කස්සප රජු යෙදූ බව පෙනේ. නූතන වෙස්සගිරියේ තිබී හමු වූ IV මහින්දට (ක්‍රි.ව. 956–972) අයත් ශිලා ලිපියක ඔහු විසින් ඉසිරමෙනු බො උපුල්වන් කසුබගිරිරද් මහ වෙහෙරට[4] නිත්‍ය වශයෙන් තිසා වැවෙන් ජලය සැපයීම පිළිබඳව සැලකිලිමත් වූ බව සඳහන් කරයි. මෙහි ඉසිරමෙනු බෝ උපුල්වන් කසුබගිරි රජ මහා විහාරය යනු වෙන් හඳුන්වනු ලැබුයේ ඉසුරුමුනි විහාරය බව අපට පැහැදිලි වේ. මේ අනුව මහාවංශයේ එන කස්සප රජු හා ඉසුරුමුනි විහාරය පිළිබඳ තොරතුරු තවදුරටත් විශ්වාස කළහැකි වන්නේ ඉසුරුමුනි පර්වතයේ ඇති කුඩා ගල්විහාරය සහිත පිළිමය ඒ ආසන්නයේ ඇති මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තියට වඩා පැරණි කාලයට අයත් වන බවය. අනෙක් අතට මෙම නිර්මාණ දෙකින් එකක් මුලින් සහ අනෙක පසුව කරනු ලැබුවද, මහාචාර්ය පරණවිතාන හා මහාචාර්ය ලොහයිසන් පෙන්වා දෙන පරිදි මුලින් කරන ලද්දේ මෙම මූර්තිය නම් බෞද්ධ මධ්‍යස්ථානයක දෙවිවරුන් හෝ හින්දු දෙවියෙකු බුදු පිළිම ගෙය

---

1. – එම – පරි. 34, ගාථා 14
2. – එම – පරි. 36, ගාථා 128
3. එස්. පරණවිතාන, අනුරාධපුරය යුගය විද්‍යාලංකාර විශ්ව විද්‍යාලීය මුද්‍රණාලය, අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන සංස්කරණය, 1961, පිටුව 169.
4. E. Z., Vol I, p. 31.

කට මදක් ඉහලින් මූර්තිමත් කරතැයි සිතීම තරමක් අසීරු කරුණකි. එමෙන්ම මුලින් මෙම හින්දු සංකල්පවාදී දේව මූර්තිය නිර්මාණය කර තිබුනේ නම් ඊට පසු කාලයක එම මූර්තියට මදක් පහතින් මෙවැනි බෞද්ධ පිළියමගෙයක් නිර්මාණය කෙරෙනු ඇද්ද යන්න පිළිබඳව මෙහිදී අපට සාධාරණ සැකයක් පහළවේ.

අංගුත්තර නිකායේ මහා වග්ගයේ ආජඤ්ඤ සූත්‍රයේ[1] අංග අටකින් යුක්ත වූ අශ්වාජානෙයයා රජුන්ගේ පරිහරණය යඳහා සුදුසු වන බව ප්‍රකාශකොට ඇත. එසේම අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ ද[2] අශ්වා ජානෙයයා ගුණාංග සතරකින් යුක්ත වන බවද සඳහන් කොට ඇත. අනෙක් අසුන්ට වඩා මෙම ආජානෙය අශ්වයා විශේෂ ගුණාංගයන්ගෙන් යුක්ත සුවිශේෂ උතුම් අශ්වයෙකු ලෙස විස්තර කොට ඇත.

ආජානෙය අශ්වයා අනෙකුත් අසුන් මෙන් ආහාර බඳුන ඉදිරියේ සිටියද එම ආහාරය ගැන නොසිතයි. බුදුන්වහන්සේ සන්ධ තෙරුන්හට[3] දේශණා කරන පරිදි ආහාර භාජනය ඉදිරියෙහි බඳනා ලද භද්‍රවූ අශ්වාජානෙයයා මෙසේ සිතයි. අශ්වයන් දමනය කරන පුද්ගලයා (අස්දමීසැරි) අද මා ලවා කුමක් කරවන්නේද? ඔහට මම අද කුමක් පෙරලා කරනෙම්ද? මෙසේ තමන් විසින් කළ යුතුවූ කාර්යය ගැන සිතනවා විනා තමා ඉදිරියේ ඇති ආහාර භාජනය ගැන අශ්වාජානෙයයා නොසිතයි. සන්ධ තෙරුණු වහන්සේට[4] තව දුරටත් කරුණු දක්වන බුදුන්වහන්සේ ඒ ලෙසින්ම භද්‍ර වූ පුරුෂාජානෙයයා වනාන්තරයට ගියද වෘක්ෂයක් මුලට ගියද, ශුන්‍යාගාරයට ගියද කාම රාගයෙන් ගන්නා ලැබූ කාම රාගයෙන් මඩිනු ලැබූ සිතින් වාසය නොකරන බවත් කාමරාගයාගේ ඇති නිස්සාර භාවය සත්‍යවශයෙන්ම දන්නා බවත් පැහැදිලි කොට දී ඇත. එසේම ව්‍යාපාදයෙන්ද, ථිනමිද්ධයෙන්ද, විචිකිත්සායෙන් මඩනා ලද සිතින් වාසය නොකරයි. විචිකිත්සාවගේ නිස්සාරභාවය නිත්‍ය වශයෙන්ද දන්නේය. හේ ආපය, තේජස, වායු හෝ පෘථිවි නිසා ධ්‍යාන නොකරයි. සන්ධයෙනි, භද්‍රවූ පුරුෂාජානෙයයා ඉන්ද්‍රයා සහිත බ්‍රහ්මයා සහිත ප්‍රජාපතී සහිත දෙවියෝ දුරදීම නමදනාහ. යම් වූ අරමුණක් නිසා ධ්‍යානය කරහු නම් තොපගේ ඒ අරමුණ නොදනුමෝ නම්, පුරුෂාජානෙයයෙනි, තොපට නමස්කාර වේවා! පුරුෂොත්තමයෙනි තොපට නමස්කාර වේවා!

අංගුත්තර නිකායේ දැක්වෙන මෙම පාඨය අශ්වාජානෙයයා සහ පුරුෂාජා-නෙයයා සතු ගුණාංග මැනැවින් පැහැදිලි කරදෙයි. මේ අනුව අශ්වා ජානෙයයා උතුම් වූ කුලයකට අයත් අශ්වයෙකි. එසේම පුරුෂාජානෙයයාද උතුම් වූ කුලයකට අයත් මහා පුරුෂයෙකි. අශ්වාජානෙයයා එදිනෙද තමාට පැවරෙන සියළු කටයුතු පිළිබඳ මහා අවබෝධයකින් සිටී. ධ්‍යානලාභී වූ පුරුෂාජානෙයයාද සියල්ල අවබෝධකරගත් සිතින් වාසය කරයි.

ගැමුණු කුමරුගේ දසමහා යෝධයෝ අතුරෙන් කෙනෙකු වන සුරනිමල පිළිබඳව සඳහන් කෙරෙන මහාවංශය[5] මෙන්ම රසවාහිනියද[6] ඔහු පුරුෂාජානීය යනුවෙන් හඳුන්වා ඇත. සුරනිමල පිළිබඳව රසවාහිනිය මෙන්ම මහාවංශයද දක්වන

---

1. Anguttara Nikaya, Buddha Jayanthi Tripitaka Series, Vol. XXII, Part V, With the Sinhalese Translation, Mahavaggo, Ajanya Sutta, p. 66.
2. එම, ත්‍රිපිටක 11 කාණ්ඩය, චතුක්ක නිපාත
3. අංගුත්තර නිකාය, පළමුවන කාණ්ඩය VI, නිස්සය වග්ගො, සන්ධ සුත්තං පි. 608
4. - එම - පි. 611
5. මහාවංශය, පරි. 23, ගාථා 31.
6. පණ්ඩිත කිරිඇල්ලේ ඥාණවිමල මහපෙර සංස්කරණය, රසවාහිනී පිට 188 සුරනිමලතිස්ස වත්ථු

කතා පුවත සත්‍යයෙන් තොරයැයි පහසුවෙන් බැහැර කළ නොහැක. තමාට පැවරුන යම්කාර්‍යයක් ඇත්නම් එය ඉතා ඉක්මණින් නිවැරදි ලෙසත් නිම කිරීමෙහිලා සුරනිමල ඉතා දක්ෂයෙකු බව ඔහු පිළිබඳව මහාවංශයේ දක්වන විස්තරයෙන් ඉතා පැහැදිලිව ප්‍රකට වේ.

කඩවිට්ගම සිට කසාතොටටත්, එහි සිට ප්‍රථමවරට අනුරාධපුරයට නුදුරු දෙරමඩලා ගමට පැමිණීමත් එතැනින් හිසාවැව නහා මහාබෝධිය, ථූපාරාමය හා කඩවීදිය ඇතුළු සෑම ස්ථානයකම ඇවිද නැවත ද්වාරමණ්ඩලයට පැමිණ කුණ්ඩල බ්‍රාහ්මණයා හමුවීමත් නැවත එහි සිට කසාතොටට පැමිණීමත් එක දිනයකින් සූරනිමල නිමකර ඇත.1 මොහු මෙවැනි දීර්ඝ හා දුෂ්කර ගමනක් ඉතා ඉක්මණින් හා නිවැරදිව නිමකිරීමට ආජානෙය අශ්වයා අපට සිහිපත් කරවන්නාහි. කසාතොට සිට දිසාභය කුමරුත් ද්වාරමණ්ඩල ග්‍රාමයේ (අනුරාධපුරයට නුදුරු) සිටි කුණ්ඩල නම් බ්‍රාහ්මණයාත් සුරනිමලගේ ගමන් වේගය පිළිබඳව මවිතයට පත් වූ බව මහාවංශය හා රස වාහිනිය එක ලෙසින්ම සඳහන් කරයි. සූරනිමලගේ මෙම අධිවේග ගමනා කිරීම පිළිබඳ තතු දැනගත් කුණ්ඩල බ්‍රාහ්මණයා හෙතෙම පුරුෂාජානිය (පුරුෂාජානියො අයං) යනුවෙන් සඳහන් කොට ඇත. අසකු ගමනට යොදා නොගෙන මෙවැනි ඉතා දීර්ඝ දුර ප්‍රමාණයක් ඉතා සුළු කාලවේලාවකින් ගමන් කොට නිමකිරීම විශේෂ වූ සිද්ධියක් වශයෙන් සැලකීමට හේතු වූවා විය හැක. මේ අනුව සූරනිමල මහා පුරුෂ උත්තම යෙකු මෙන්ම ජවාධික බල ඇති පුරුෂයෙකු ලෙසද සලකන්නට ඇතැයි අනුමාන කළ හැක. ආජානෙය අශ්වයා සතු ගුණාංග සතර ලෙස2 මනා රූ සපුව, ශක්තිය, වේගය සහ මනාලෙස හැඩුනු අඟ පසඟ දක්වා ඇත.

අපගේ විමර්ශණයට භාජනය වන ඉසුරුමුනියේ මිනිසා සහ අශ්ව හිස සහිත මූර්තියේ ශිල්පීය ක්‍රමයද මෙහිදී සැලකිල්ලට ගත යුතු වේ. මූර්තියේ සාමාන්‍ය පෙනුමෙන්ම මෙම පුරුෂ රූපය ආරෝහ පරිනාහ දේහයකින් යුත් පුරුෂයෙක් බව පැහැදිලි වේ. හිසෙහි ඉදිරි කොටසෙහි කෙස් මුඩු කොට ඇති බවත් පෙනේ. හිසෙහි 3/4ක පමණ ප්‍රමාණයක් වසා සිටින සේ ආවරණය කොට ඇත. ඉසුරුමුණියේ මිනිසා සහ අශ්ව රූපය සහිත මූර්තිය පිළිබඳව අදහස් දක්වා ඇති පාකර්3 මේ මූර්තියෙන් දැක්වෙන පුද්ද සෙබලා ලෝහ වර්ගයකින් තැනූ හිස් ආවරණයක් පැළඳ සිටින බව සඳහන් කොට ඇත. එහෙත් ඉතා සියුම් ලෙස පරීක්ෂා කිරීමේදී එය ලෝහයෙන් තැනූ හිස් වැස්මකට වඩා රෙදි වර්ගයකින් බඳින ලද ජටාවක් ලෙස පෙනී යයි. ලෝහමය ශීර්ෂාවරණයක් නම් මුළු හිසට එයින් ආවරණය විය යුතුය. එහෙත් මේ මූර්තියේ හිසෙහි ඉදිරි කොටස වැස්මෙන් ආවරණය වී නැති සැටි පැහැදිලිව දැකිය හැක. හිසෙහි ඇති ආවරණය හිසට පිටු පසින් කෙළවරක් පහතට වැටී ඇති ආකාරයක් දැකිය හැක. ලෝහ හිස් වැස්මක් එසේ හිසේ පිටුපසින් පහතට වැටියනොහැක. රෙදි විශේෂයකින් පටි දෙකකින් යුක්තව එක පටක් යටින් තවත් පටක් ගැටගසා ඇති සැටියක් දැකිය හැක. ගෝපිනාථ රාවෝ4 ජටාභරණ ලෙස දක්වා ඇති අදහස මේ සඳහා වඩාත් පිළිගත හැකි සේ පෙනේ. කුණ්ඩල බ්‍රාහ්මණයාගෙන් ලියුමක්ද, පූර්ණවර්ධන නම් වස්ත්‍රද, බොහෝ පඬුරුද ගෙන දීසාභය කුමරු වෙත ගිය සූරනිමලට දස දහසකින් සතුටු කොට ඔහු, කෙස් ලියවා නහවා පූර්ණ වර්ධන වස්ත්‍ර යුග්මයක්ද මනා ගඳමල්ද

1. මහාවංශ, පරි 23, ගාථා 22 – 35
2. අංගුත්තර නිකාය, චතුක්ක නිපාත.
3. H. Parker, op. cit, p. 545.
4. Gopinatha Rao, Elements of Hindu Iconography, Vol. 1, part 1, Plate IX, fig 3.

(දී) දුහුල් පටකින් හිස වෙළවා (කුමරු) වෙත එඩූහ. යනුවෙන් රසවාහිනිය සඳහන් කරයි.[1] මෙහි කෝලියවා හෙවත් හිසමුඩු කිරීමත්, වස්ත්‍රයක් හැඳවීමත්, දුහුල් පටකින් හිස වෙලීමත් ඉතා වැදගත් සිද්ධීන් ලෙස ගත හැක. ඉසුරුමුනියේ ඇති පුරුෂ රූපයේ මුඩුකොට ඇති හිසෙහි ඉදිරි කොටසත්, යටිකයෙහි ඇති වස්ත්‍රයත්, හිසෙහි ඇති ජටාවත් රසවාහිනියේ එන මේ විස්තරය සමග කුමන අන්දමේ සම්බන්ධතාවයක් ඇත්දැයි යන්න විමසිල්ලට භාජනය විය යුතුය. ඉසුරුමුනියේ අශ්ව හිස සහිත වාඩිවී සිටින මිනිසාගේ හිසෙහි ජටාවත්, හිසකෙස් කොටට කපා ඇති සැටිත් මූර්ති ශිල්පියා පැහැදිලිවම දක්වා ඇත. මෙම මූර්තියේ ආභරණ විරලය. ශරීරයේ යටිභාගය වස්ත්‍රයකින් වැසී ඇති අතර වම් පාදයේ සහ දකුණු පාදයේ දණහිසට මදක් ඉහලින් එම වස්ත්‍රයේ කෙළවර දැකිය හැක. බාහු වළලු පැළඳ සිටී. වම් පයෙහි වළල්ලක්ද පැළඳ සිටින බවක් පෙනේ. යුද සෙබලෙකුට සුදුසුවන පරිද්දෙන් ආභරණ පැළඳ සිටින බව පෙනී යයි.

ඇත දෙනෙත් දල්වා බලා සිටින සේ දක්වා ඇති මේ පුරුෂ රූපය කිසියම් ධ්‍යාන යකට සම වැදුනු ආකාරයේ ස්වරූපයක් පෙන්වතැයි කීම වඩා යෝග්‍ය වේ යයි සිතමි. කිසියම් අරමුණක් කෙරෙහි කල්පනා හරිතව පසුවන ආකාරයක් දෙනෙතින් සහ මුහුනේ ඉරියව් වලින් දැකිය හැක. ආචාර්ය වින්සන්ට් ස්මිත්ද[2] මේ හා සමාන අදහසක් දක්වා ඇත. දීඝාභය කුමරු විසින් සූරනිමල වෙත පවරනු ලැබූ භාරදූර කාර්යය පිළිබඳව ඔහු මොහොතක් මෙසේ මෙනෙහි කරන්නට ඇත්දැයි මේ අනුව අපට අනුමාන කළ හැක.

අරිට්ඨ කුමරු පන්සියයක් ඉසුරන් සහිතව මිහිඳු හිමිගෙන් පැවිදි බව ලබා විසූ තැන දේවානම් පියතිස්ස රජු විසින් මෙම විහාරය කරවන ලද බව සඳහන් වේ.[3] මෙසේ පැවිදිබව ලැබූ අය ඉස්සරනම්වූ කුලයේ අය වූ බැවින් මෙය ඉස්සරසමනාරාම නොහොත් ඉසුරුමුනි විහාරය ලෙස හැඳින් වූ බව මූලාශ්‍ර පෙන්වා දෙයි. මේ අන්දමින්ම පන්සියයක් වෛශ්‍යයන් මෙම තෙරුන් වහන්සේ වෙත පැවිදිව විසූ තැන කළ වෙහෙර වෙස්සගිරි නම් වූ බවද සඳහන් වේ. මේ අනුව ඉස්සරකුලයේ අය පැවිදිව විසූ විහාරය උසස් ලෙස සැලකීමට එම විහාරවාසී භික්ෂූන් උත්සාහ දරන්නට ඇත. පුරුෂාජානීය වශයෙන් හඳුන්වන ලැබූ සූරනිමල ගේ පියාද ඉස්සර කුලයට[4] අයත් වූවෙක් ලෙස සඳහන් වේ. ධම්මපදයේ එන[5] එක් ගාථාවක (බුද්ධ වග්ගයේ) පුරුෂාජානීයයා දුර්ලභය. ඒ පුරුෂයා සැමතැන්හිම පහල නොවේ. යම් තැනක ඒ ශ්‍රේෂ්ඨයා පහලවේද, ඒ කුලය (පරපුර) සැපතට පත් වේ. යනුවෙන් දක්වා ඇත.

සූරනිමලද මේ යුගයේ පහල වූ දුර්ලභ ගණයේ පුද්ගලයෙක් වශයෙන් සලකන්නට ඇත. ඔහු පුරුෂාජානීය වශයෙන් මහාවංශය මෙන්ම රසවාහිනියද හුවා දක්වූයේ මේ නිසා වන්නට ඇත. ලංකා වංශකථා ඉතිහාසයේ වෙනත් තැනක සාමාන්‍ය පුද්ගල

---

1. රසවාහිනිය පිටු, 189
2. Vincent Smith, op. cit, p. 148, "The expression on the face is that of calm and abstract but not unconscious dignity"
3. මහාවංශය, පරි. 20, ගාථා 15
4. මහාවංශය, ඒ. පී. බුද්ධදත්ත ථෙර සංස්කරණය, කොළඹ 1959, පරි. 23, ගාථා 19
5. Pali Text Series, Vol. VI, The Khuddakanipatha Dhammapada Pali of Suttanta Pitaka, Edited by Halgastota Sri Devananda Maha Thero, Colombo, 1956, p. 16. V. 15,

   දුල්ලභෝ පුරිසාජඤ්ඤො න සො සබ්බත්ථ ජායති
   යත්ථ සො ජායති ධීරො තං කුලං සුඛමෙධති.

යෙකු හැඳින්වීම සඳහා පුරුෂාජානීය යන පදය යොද ඇති බවත් දක්නට නොමැති බැවින් සුරනිමල පුරුෂාජානීය වශයෙන් හැඳින්වීමේ විශේෂත්වයක් තිබිය යුතු වේ. ඒ අනුව ඉස්සර කුලයට අයත් සුරනිමල ඉසුරුමුනි විහාරයේ පුරුෂාජානීය යන්න සංකේතවත් කරමින් මූර්තිමත් කිරීම නිසා එම ගල් පර්වතයේම දක්නට ඇති බුදු පිළිමයට අගෞරවයක් සිදු නොවීමේ වගකීම කලාකරුවනට භාරගත හැකිවනු ඇත.



Parjanya and Agni (Horse), carved on face of rock at "Isurumuni", Anurādhapura, *circa* 6th century.

Art of the Ancient Sinhalese
Senarat Paranavitana
Lake House Investment Ltd,
Colombo. 1970 plate 23